රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No. SA/APM/02/02/05    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2022.11.23

රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක - 04/2022

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
ආයතන ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>GPS මෘදුකාංගය හරහා වැටුප් පිළියෙල කිරීම.</u>**

දැනට වසර 25 පමණ කාලයක සිට රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ඇතුලුව සියළුම රජයේ ආයතන ( Spending Units) විසින් වැටුප් සකස් කිරීම සඳහා වැටුප් සැකසීමේ මෘදුකාංගය (GPS/Government Payroll System) භාවිතා කරනු ලබයි. මෙම කාලය තුල වරින් වර අනුපිටපත් (version) කිහිපයක් නිකුත් කර ඇති අතර, රජයේ ආයතන විවිධ අනු පිටපත් භාවිතා කරන බව වාර්තා වී ඇත.

විශාල කාර්ය මණ්ඩලයක් සිටින ආයතනවල මෙම මෘදුකාංගය භාවිතා කරමින් යම් යම් වැටුප් වංචාවන් හා වැරදි සිදු වන බවට මෙම දෙපාර්තමේන්තුව වෙත වාර්තා වී ඇත. තවද දැනට භාවිතාවන GPS මෘදුකාංගය නවීන තාක්ෂණයට අනුරූපිව වැඩි දියුණු කිරීමේ අපහසුතාවයක් පවතී. එම නිසා වැරදි හා වංචා නැවැත්වීමට හා නවීන තාක්ෂණයට ගැලපෙන ආකාරයට දැනට මුදල් අමාත්‍යාංශය මගින් වැටුප් සකස් කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස නව වැටුප් මෘදුකාංගයක් සකස් කර භාණ්ඩාගාර දෙපාර්තමේන්තු තුල අධ්‍යයනය කරමින් පවතින අතර එහි සාර්ථකත්වය මත මෙම නව වැටුප් මෘදුකාංගය දීප ව්‍යාප්තව භාවිතා කිරීම සඳහා කටයුතු කිරීමට අවධානය යොමු කර ඇත.

මෙම පසුබිම තුල, නව මෘදුකාංගය ස්ථාපිත කර ක්‍රියාත්මක කරන තෙක් දැනට පවතින GPS පද්ධතිය අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතුවේ. එබැවින් දැනට පවතින GPS මෘදුකාංගය භාවිතා කළ හැක්කේ 32 bit සහිත පරිගණකය තුල පමණක් වන බැවින්ද නව තාක්ෂණයට අනුගත වීමට නොහැකි බැවින්ද මෙම මෘදුකාංගයේ භාවිතා කිරීමේ කටයුතු ප්‍රධාන මූල්‍ය නිලධාරී හෝ ප්‍රධාන ගණකාධිකාරීගේ අධීක්ෂණය යටතේ පමණක් සිදු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

එමෙන්ම මෙම මෘදුකාංගයෙහි දැනට ක්‍රියාත්මක වනුයේ 7.1 අනු පිටපත වන අතර සමහර වියදම් ඒකක මෙම යාවත්කාලීන කරන ලද මෘදුකාංගය වෙනුවට පැරණි අනුපිටපත් භාවිතා කරන බව මෙම දෙපාර්තමේන්තුවට නිරීක්ෂණය වී ඇති බැවින් පැරණි පිටපත භාවිතා කරන ආයතන නව අනු පිටපත (Version) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව   பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை.   General Treasury, Colombo 01, Sri Lanka.
General-Tel.: +94 11 2484500/600   Ext.: 1149
Director General - Tel.: +94 11 2484728
Fax: +94 11 2484869
Fax: +94 11 2473856
Website: www.sad.gov.lk
e - mail : dgsa@sad.treasury.gov.lk

තවද, අවකරණ යැවීම සඳහා භාවිතා කරනු ලබන "Remittance" යන වරණය යම් යම් අවස්ථාවන් වලදී අවභාවිතා කර මහා පරිමාණයේ වැටුප් වංචාවන් සිදුකල හැකි බව මෙම දෙපාර්තෙමේන්තුවට නිරීක්ෂණය වී ඇත. එබැවින් මු.රෙ 238 (4) (අ) අනුව අදාළ අවකරණ පමණක් අදාළ වරණය යටතේ සිදු කරන ලෙස අවධාරණය කරමි. යම් කාර්යමණ්ඩල සාමාජිකයෙකුට ඉහත සඳහන් අවකරණ වලට අමතරව යම් ප්‍රේෂණයක් සිදු කිරීමට අවශ්‍ය වන්නේ නම් ශේෂ වැටුප ප්‍රේෂණය කරනු ලබන බැංකුව වෙත අදාළ නිළධාරියාට ස්ථාවර නියෝගයක් ලබා දීමෙන් අදාළ අවකරණ සිදු කරන ලෙස උපදෙස් ලබාදීම සුදුසු වේ.

තවද, මෙම GPS මෘදුකාංගය සැලසුම් කර ඇත්තේ ප්‍රධාන මූල්‍ය නිළධාරී / ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී ගේ දැඩි අධීක්ෂණය යටතේ භාවිතා කිරීමට බව ඔබේ අවධානයට යොමු කරමි. මෙම මෘදුකාංගය භාවිතා කරමින් සිදුවිය හැකි වංචා හා වැරදි වලක්වා ගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධව නිකුත් කර ඇති සියලුම චක්‍රලේඛවල දක්වා ඇති උපදෙස් අනුගමනය කරන ලෙස දන්වා සිටිමි. තවද චක්‍රලේඛ අංක 171/2004 සමග නිකුත් කරන ලද රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරුන් අනුගමනය කල යුතු පාලන ක්‍රම පිළිබඳ ඇමුණුම මේ සමඟ ඉදිරිපත් කරන අතර එහි සඳහන් සියලු පාලන ක්‍රම අනුගමනය කල යුතු බව අවධාරණය කරමි. මේ සම්බන්ධව යම් උපදෙසක් හෝ වැඩි විස්තර ලබා ගැනීම අවශ්‍ය වන්නේ නම් මෙම දෙපාර්තමේන්තුවේ පහත සඳහන් නිලධාරීන් ඇමතීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

(1) එම්.ඩී.එන්.එස්. ජයරත්න මෙය
අධ්‍යක්ෂ
දු.අ.-0112440857 / 0714484458

(2) එන්.ඒ.කේ.එස්. ඩයස් මෙය
තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිළධාරී
දු.අ - 0701560673

(3) ඒ.සී. දිල්හාරි මිය
තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර
දු.අ - 0771377860

ඩබ්. ඒ. සමන්ත උපනන්ද
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්